# පින්බර කිරි වෙහෙර



දමයන්තිගේ මතක සටහන්

මේ උදාවන්නේ ජේසු සමිදානන් සිහි කරන ලොව පුරා වෙසෙන කිතුණු බැතිමතුන් සමරණ අසිරිමත් නත්තලයි. මම බෞද්ධ වුනත් නත්තලට අපි කවුරුත් කැමතියි. අපිට නත්තල් කාලෙට අලුත් ඇදුම් සෙල්ලම් බඩු ගොඩාක් ලැබෙනවා වගේම එකල අපේ තාත්තාසෑම වසරකම දෙසැම්බර් පාසල් නිවාඩුවට කතරගම එක්කරගන යන්නත් අමතක කරන්නේ නැහැ. කිරි වෙහෙර වන්දනා කරපසුවදා සෙල්ලකතරගම වැඩිහිට කන්දත් වන්දනා කරනවා.

ඒ වනවිට මට හිටියේ අක්කවිතරක් වුනාට මල්ලියි නංගියි පවුලට එකතු වුනාට පසුව එම ගමන් නතර වුනත් ඊට වසර කීපයකට පසුව බොරැල්ලේ පන්සලේ හිමි නමකගේ බාරයකට විශාල පහන් පින්කමක් කිරි වෙහෙර අබියස කිරීමට සංවිධානය කර තිබුනබැවින් විවිධ පලාත් වලින් බස් රථ හතලිහක පමණ සැදැහැවත් පිරිස් මේ පිංකමට සහභාගි වීම සදහා බෙල්ලන්විල පන්සලට රැස්වෙලා සීතල උදුවප්මහේ නත්තල් උදාවත් සමග ගමන් ආරම්භ කරනවා. අපේ ගමෙනුත් සංවිධානය කරපු බස්රථයක් ගමනටඑක්වන අතර මගේ ආච්චි අම්මාත් බොහොම කැමැත්තෙන් ඒ සදහා සහභාගි වනවිට මගේ අම්මා මාවත් යවනවා ආච්චිඅම්මාව බලාගන්න කියල. මේ විදිහට මට නැවතත් වසර ගනනාවක් එකදිගට කතරගම යන්න වාසනාව ලැබුනා. මේ ගමනට වයස්භේදයකින් තොරව තරුණ අය පවා සහභාගි වුනා. විසාල පිරිසක් සහභාගි වුනත් මනා විනයක් ඇතිව හොද පාලනයකින් මෙම පිංකම් සංවිධානය කර තිබුනා. කලුතර බෝධිය රත්නපුර සමන් දේවාලය තිස්සමහාරාමය වැද පුදාගන බොහෝ රෑ බෝවීකතරගමට ලගාවන පිරිස් පාන්දරින්ම සිල් අරගන හවසට පින්කමට සහභාගි වෙනවා. මම අපගේ සිල් නොගන්න පිරිස සමගඑකතු වුනත් නිතරම ආච්චි අම්ම ලග ගැවසෙනවා. කලක් ගත වුනාට පසුව මගේ මල්ලිත් මට වඩා වසර හතක් බාලයි මේගමනට එකතු වුනා. මේ යන ගමන් වල වියදම් මගේ පියා දරනවා පමණක් නෙවෙයි මගවියදම් වලට කැමති දෙයක් ගන්න අපට මුදල්ද දෙනවා. මේ බව දැනගන සිටි මල්ලි මට කරදරකර සෙල්ලම් බඩුතොලොම්බර් බඩු අරගන ඊලගට නාන්න මැණික්ගගට නාන්න ඕන කියලගිහින් ගගේ සෑහෙන වෙලා ගත කරමින් සිටිනවා. මට ගොඩට ගන්නත් අමාරැයි. මේ ගැන මම ගෙදරඇවිත් කියනවා.අපේ නඩේ අනිත් අයගෙනුත් මේ විස්තරදැනගත් මගේ පියා අපේ ගමනත් නතර කලා.

ඊට පසුවත් කිහිප වරක් පවුලේ අය සමගත් පසුකාලීනව මගේ දරුවන් සමගත් කිරි වෙහෙර වහන්සේ වන්දනා කරල තියෙන මම දැනුත් ලංකාවට ගියහම මුලින්ම දලදා වහන්සේ වැද පුදාගන දෙවනුව කිරි වෙහෙර වදින්න තමයි කැමති. මට මතකයි එකලමම අලුත් වසරක පාසල් වාරය පටන් ගත්තම විවේක කාලයට යෙහෙලියන් වටකරගන පිල් විදහා නටනමොණ රැගැන වැඩිහිටිකන්දේ මග දිගට හමුවන රිලව් රැලගේ විස්තර ආසාවෙන් කියනව. වර්තමානයේ කතරගම් පුරවරයට කාලය විසින් ලොකුවෙනසක් කරල තිබුනත් කිරි වෙහෙර හා කතරගම දේවාලය අවට මනා සංවිධානයක් ඇතුව සිත් පහන් වන ලෙස පාලනය වීම සැබවින්ම සතුටට කරුණක්.

පෞරාණික ඉතිහාසයකට උරුමකම් කියන මේ උතුම් පුදබිම සොලොස්මස්ථාන වලින් එකක් වාගේම අෂ්ඨඵල බෝරැක් නමක්වැඩ වාසය කරන මෙම පුදබිම



සුවිශේෂී පුදබිමක්ද වෙනවා. බුදු රජාණන් වහන්සේ තෙවනවර ලක්දිවට පැමිණි අවස්ථාවේ ඈතඅතීතයේකාචාගම නමින් හැදින් වූ කතරගම පුරවරයටවැඩ එකල එහි පාලකයා වූ මහසෙන් රජුට අයත් උයනක තවත් රහතුන් වහන්සේලා පන්සියයක් සමග සමවත් සුවයෙන් වැඩ සිටින බව දැනගත් මහසෙන් රජු එහි පැමිණි බවත් බුදුරජාණන්වහන්සේගේ ධර්ම දේශනාවෙන් පැහැදී එම අවස්ථාව සිහිවීම පිණිස මහසෙන් රජු විසින් කිරි වෙහෙර නිර්මාණය කලබවට ජනපුවාදයේ සදහන් වෙනවා.

මා ලමා අවදියත් යොවුන් අවදියත් අතර දෝලනය වන මතකයන් අතරින් ගත් කල අව් රශ්මියෙන් කාස්ටක වූ කොලොම්පුර-වරයේ සිට කතරගම් සීමා මායිමට ලගා වන විටම සබෑ වෙනසක් ගතට වගේම සිතටත් දැනෙන බවනම් නොකියාම බැහැ. නිල් යායක් වන් රෑස්ස වනස්පතීන් දෙපසින් ගමන් කරන විටත් දකින සැම අතකින්ම පෙනන ගස්වැල් වලින් මතුවන සොබා අසිරියමගේ රට ගැන ආඩම්බරයක් ඇති කරවනවා.

මැණික් ගග පසු කිරීමට පෙර නොයෙකුත් වර්ණ වලින් පිරි පබලු මාල සෙල්ලම් බඩුවලින් පිරි කඩපෙල පරිසරයට අමුතුම අලංකාරයක් ගෙනදුන්නා. සොදුරැ මැණික් ගග අසල සෙවන කරනකුඹුක් ගස් පෙලත් නිල්පාටින් ගලා බස්නා මැණික් ගගේ දිය දහරාවත් දකින කල සිතට ගතට දැනෙන සිසිලස වචනවලට පෙරලිය නොහැකියි වගේම ඒනිල්වන් දිය දහරාව වෙනුවට අද දකින වේලී ගිය මැණික් ගග දකින විට සිතට දැනෙන්නේ මහ බරක්. මට මතක කාලවලදී මැණික්ගගේ වතුර පිරිලා කොයි වෙලෙත් සෙනෙගෙන් අඩුවක් නැහැ. වන්දනා නඩවල සමහරැ ගගේ බැහැලා ස්නානය කරමින්පුබෝදමත් වන අතර සමහරැ පඩිපෙලවල්වල ඉදගනත් තවත් අය මාලුන්ට පොරි දමමිනුත් විනෝද වූ අන්දම මතකයට නැගෙනවිට එකල මිනිසුන් මොන තරම් මානසක නිදහසකින් ජීවිතයට මුහුණ දුන්නද කියල හිතෙනවා. වන වෘක්ෂ ලතාවන් පසුකරගනඇවිත් මකර තොරණ හා කතරගම දේවාලය පසුකරන බෞද්ධ පිරිස් මුලින්ම යන්නේ කිරි වෙහෙර වහන්සේ වන්දනා කිරීමටයි.

කිරි වෙහෙර වහන්සේ වන්දනා කරන මග තිබුන වැලිපාර ඒ දෙපැත්තේ තනිනිල්පාට ඇතිරිල්ලක්වන් තිබුණ තනකොලකිසිවක් දැන් නැහැ.රට වෙනස් වෙනවා හා සමානවම ස්වභාවධර්මය විසින්ම ඒවත් සොරාගන. එකල පින්කම් වලදිත් සිල්සමාදම් වූ අයත් සුදුවතින් සැරසි ලාතණ බිස්ස තුල බිම වාඩි ගන සිටි සැටි මතකයට නැගෙන විට නම් දුකක් සිතට දැනෙනවා.ඒදෙපස දිගටම ආප්ප කඩ මල් කඩ සහ දිග බංකු පේලි මත වාඩිගන උණු ආප්ප කමින් තේ කෝපි බීපු අපේම කියා සිතට දැනෙනනිරහංකාර මිනිසුන්සේම එම සුන්දර පරිසරයද ලක්මාතාව ගෙන් බොහෝ දුරට ඈත් වූ සෙයක් දක්නට ලැබෙනවා. ඒ කොහොමවුනත් එදා වගේම අදත් කිරි වෙහෙර වහන්සේ එකසේ සැමටම මෙත් කරුණා පාමින් සුදටසුදේ බබලමින් වැඩ සිටිනවා. එදවසමගේ ලාමක මනසට දැනුන හා සමානවම අදටත් කිරි වෙහෙර අබියසට ගියහම සිත දැහැනකට සම වදින ගතියක් දැනෙනවා.

එකල විනීතව නෙළුම් මල් අතැතිව සුදවතින් සැරසිලා කවුරුත් වන්දනා කරනවිට දකින අයට මෙත් කරුණා ගුණය සිත්වල ඉබේමඇතිවන දෙයක්. වර්තමාණයේ නම් බොහෝ දුරට ඒ තත්වය පිරිහිලා සමහරැ පූජනීය ස්ථානකරා යන්නේ හුදෙක් විනෝද ගමනක්යන විලසින් පාට ඇදුමින් සැරසිලා වුවත් තව තරුණ කොටසක් තුල ලොකු පිබිදීමක් දක්නටත් තිබීම සුබ ලකුණක්. ඒ කොහොමවුනත් කිරිවෙහෙරඅබියසත් බෝධීන් වහන්සේ සහ දේවාලය අබියසත් විනීතව හැසිරීම කා තුලත් දක්නට ලැබෙනවා. මනාසංවිධායක් ඇතිව පාලනය වුනත් අතීතයේ අප දැකපු සතුටු වූ කාවඩි නැටුම් වල පිලිවෙලක් තිබුන මුත් වර්තමාණයේ නම්නොයෙක් පාට විච්චූරණ ඇදුම් වලින් සැරසිලා දකින අයට අප්‍රසාදයක් ඇති කරන බවක් පෙනෙන්න තිබෙනවා. පුරාණයේ විසූසිංහල මෙන්ම දමිල පිරිස් වනසතුන්ගෙන් ආරක්සා වෙමින් දුෂ්කර මාර්ග පසුකරමින් තම ජීවිත ගැනවත් නොතකා දැඩිභක්තියකින් වන්දනා කර මේ පින්වත් පුදබිම ලක්ෂ ගනන් බැතිමතුන්ගේ ඉමහත් භක්තියට ලක් වී තිබෙනවා.

